නම :- ........................................ පාසල :- ..................................

* I පත්‍රයේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
* I කොටසේ 1 – 20 ප්‍රශ්න සඳහා ප්‍රශ්නයකට ලකුණු 2 බැගින් ලකුණු 40 ක් පිරිනැමේ.

## I කොටස

01. පහත දැක්වෙන දෑ අතුරින් වෘත්තාකාර හැඩ ඇති වස්තුවක් තෝරා ඒ යටින් ඉරක් අඳින්න.

i. බෝලය ii. පෙට්ටිය iii. රබාන iv. රූපවාහිනිය

02. 3 200 හි අගය නොලැබෙන ප්‍රකාශය තෝරා යටින් ඉරක් අඳින්න.

i. $3 \times 200$ ii. $32 \times 100$ iii. $320 \times 10$

03. පස්වරු 6.45 මෙය අන්තර්ජාතික සම්මත ආකාරයෙන් ලියූවිට ලැබෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

i. 06:45 ii. 18:45 iii. 18:45$h$

04. පහත දක්වා ඇති දින අතුරින් සම්මත ආකාරයට ලියා නොමැති දිනය සහිත ප්‍රකාශය තෝරා යටින් ඉරක් අඳින්න.


i. 2018 – 10 – 01 ලෝක ළමා දිනය

ii. 2018 . 10 . 06 ලෝක ගුරු දිනය


iii. 2018 / 04 / 06 පාසල් පළමු වාරය අවසන් දිනය

05. මෙහි දැක්වෙන කෝණ වර්ග අතරින් මහා කෝණය දැක්වෙන කෝණයට යටින් ඉරක් අඳින්න.

i. $a$ ii. $b$ iii. $c$




06. මෙම ගණක රාමුවේ දැක්වෙන සංඛ්‍යාව ලියන්න.





07. තුන් මිලියන දෙසිය විසිතුන්දහස් එක යන සංඛ්‍යාව ඉලක්කමෙන් ලියන්න.

08. 493 – 238 සුළු කරන්න.

LIVEWORKSHEETS

09. එක්තරා පාසලක උදැසන රැස්වීමක දී විදුහල්පති තුමා පෙරවරු 7.45 ට තම කතාව ඉදිරිපත් කළේ ය. මිනිත්තු 12 ක දී එය අවසන් වූයේ නම්, අවසන් වූ වේලාව සම්මත ආකාරයෙන් ලියන්න.

10. මෙහි දැක්වෙන සංඛ්‍යා රේඛාවේ ලකුණු කර ඇති සංඛ්‍යා ලියන්න.





11. පහත සඳහන් වගුවේ නිවැරදි ප්‍රකාශය ඉදිරියෙන් '✓' ලකුණ ද වැරදි ප්‍රකාශය ඉදිරියෙන් '✗' ලකුණ ද යොදන්න.

| | |
|---|---|
| $-4 < -1$ | |
| $5 < 3$ | |
| $0 > -4$ | |

12. 123 යන සංඛ්‍යාව ආසන්න 10 ගුණාකාරයට වටයන්න.

13. අමල් තම නිවසේ සිට පාසලට ගිය ආකාරය මෙම රූපයේ දැක්වේ. ඔහු පාසලේ සිට තම නිවසට පැමිණි දිශාව කුමක්ද?




14. 13:30 මෙය පැය 12 ඔරලෝසුවේ වේලාවෙන් දක්වන්න.

15. 34091201 යන සංඛ්‍යාව සම්මත ආකාරයෙන් ලියන්න.

16. අගය සොයන්න. $4\,500 \div 100$

17. 8560 හි 5 න් නිරූපිත අගය සොයන්න.

18. එකතු කරන්න. $3000 + 300 + 30 + 3$

19. එකතු කරන්න.

| දින | පැය |
|---|---|
| 3 | 12 |
| +2 | 18 |

20. 1 සිට 5 තෙක් පන්ති පමණක් ඇති එක්තරා පාසලක සමාන්තර පන්ති 2 බැගින් තිබේ. ඒවා $1A, 1B, 2A, 2B, \ldots\ldots$ වශයෙන් නම් කර ඇත. එක් පන්තියක ආසන්න වශයෙන් සිසුන් 40 බැගින් සිටිති. මුළු පාසලේ ම සිටින සිසුන් ගණන නිමානය කරන්න.

LIVEWORKSHEETS